# බ්ලැකි මගේ සුරතල් පූසා



ආලෝකා ලියන්දෙණිය

# බ්ලැකී මගේ සුරතල් පූසා

## කතෘ : ආලෝකා ලියන්දෙණිය

කතෘ : ආලෝකා ලියන්දෙණිය
චිත්‍ර : ආලෝකා ලියන්දෙණිය
ISBN : 978-624-208-429-9
දිනය : 2025.02.08

# පිදුම

මා හට සිප්සතර
හදාරන්නට සෙවන දෙන
ආදරණීය මහාමායා
බාලිකා විදුහල් මැණියන්ට
සෙනෙහසින්
පුදන්නෙමි........

පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමයි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2025 සාහිත්‍ය මාසයට සමගාමීව පාසල් විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූයේ අප පාසලේ කළමනාකරන මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් හා සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතියි මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘතිය යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විදුහල- මහනුවර

2025.02.08



එක දවසක් හැන්දෑවේ අහස කළුකරලා ගොඩාක් හයියෙන් වැස්සා. එකපාරටම කළුම කළු පූසෙක් හොඳටම තෙමිලා අපේ ගෙදරට ආවා. ඌ සීතලෙන් වෙව්ලුවා.



අපි එයාට කන්න  දුන්නා. සීතලට ඉන්න පරණ රෙදි කැබැල්ලක් දාලා දුන්නා.



ඊට පස්සේ එයා දිගටම අපේ ගෙදරට ආවා. මම එයාට බ්ලැකී කියලා නම දැම්මා. ඒ එයා කළුම කළු නිසා. එයාගේ ඇස් දෙක කොළම කොළ පාටයි. ඒ වාගේම හරිම අහිංසකයි.



එයා හැමදාම මම ගෙදර එනතුරු බලන් ඉන්නවා මාත් එක්ක සෙල්ලම් කරන්න. එයා කැමතිම ආහාරය මාළු ඒවාගෙම එයා කැමතියි එයාගේ ඔලූව අතගානවට.



බ්ලැකී කොච්චර හොඳ උනත් එයාගේ නරක පුරුද්දක් තිබුනා. ඒ තමයි එයා කෑම සොයාගෙන ගෙවල්වලට ඇවිදින එක.



දවසක් එහෙම ගිහින් මාළු හොරෙන් කනකොට බ්ලැකිට ගහලා කකුල තුවාල වුණා. බ්ලැකි නෝණ්ඩි ගහමින් අපේ ගෙදරට ආවා.

බ්ලැකිට හොන්දටම අමාරුයි. අමාරුවෙන් පුරු පුරු ගෑවා. අප්පච්චියි මමයි බ්ලැකිව නාවලා තුවාලය සුද්ද කරලා බෙහෙත් දැම්මා.



දවස් කිහිපයක් බෙහෙත් දැම්මා. බ්ලැකිගේ කකුල පොඩ්ඩ පොඩ්ඩ සනීප උනා. දැන් අපිට හරිම සතුටුයි.





දැන් බිලැකි වෙනදා වාගේම මගෙත් එක්ක සෙල්ලම් කරනවා. මාළු හොරෙන් කන්න වෙන ගෙවල්වලට යන්නෙත් නැහැ.

සුරතල් සතුන්ට ආදරයෙන් සලකන එක හොඳ දෙයක් කියලා අප්පච්චි මට කියලා දුන්නා.



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතියක් හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නට මහාමායා පුංචි ගත් කතුවරියන් පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතියක් දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර මින් ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිවයුතු යි පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කරන්න ජාතික තලය දක්වා විවිධ අභියෝගය මැද සංකල්පය මංකොල්ලන්ට හසු වෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ ෙන් මහාමායා දියණියන් සහ . පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්වන්නේ විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසුන් ගත්කතු අංකුර බවට ලෝකය දිනන ගත්කතුවරයෙකුට වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ මාතෘ

2024. 02.08

# ස්තූතිය

මහනුවර මහාමායා බාලිකා
විදුහලේ විදුහල්පතිතුමියටත්,
ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමිය
හා පංතිභාර ගුරුතුමිය වන ප්‍රමිතා
වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්,
අනෙකුත් ගුරු මෑණිවරුන්ටත්,
ගුරු පියවරුන්ටත්, ආදරණීය
අම්මා, අප්පච්චි, අත්තම්මා හා
අච්චි අම්මාටත් මාගේ හද පිරි
ස්තුතිය පුදකරමි.